# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2023-01-09 |

පැමිණිලිකාරිය :- බී.එම්.ධම්මිකා කුමාරි මිය,
"මීගහවත්ත නිවස"
මඩදොඹේ,ගල්ලෑව
ගල්ගමුව.

වගඋත්තරකරුවන් :- 01 පොලිස් පරීක්ෂක යූ.කේ.නිහාල් ජයවීර මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
ගිරිබාව.

02. උප පොලිස් පරීක්ෂක රම්බණ්ඩා මයා,
පොලිස් ස්ථානය,
ගිරිබාව.

<u>පැමිණිලි අංක :- **HRC/AP/145/2014(W)**</u>

'මුදල් ආරවුලක් පිළිබඳ පැමිණිල්ලක් විභාග කිරීමේදී ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් පක්ෂග්‍රාහීව කටයුතු කිරීමෙන් සිදු කරන ලද අසාධාරණයක්' පිළිබඳ 2014.03.12 දින ඉහත පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මඟින් පහත කරුණු දක්වා ඇත.

පැමිණිලිකාරියට එරෙහිව ඇයගේ අසල්වැසියෙකු වන සුමනාවතී යන අයෙකු මුදල් ආරවුලක් පිළිබඳව පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් විභාග කිරීම සඳහා පැමිණිලිකාරිය පොලිස් ස්ථානයට කැඳවන ලද බවත්, පළමු දිනයේදී එම පැමිණිල්ල විභාග කරන ලද්දේ දෙවන වගඋත්තරකරු විසින් වන බවත්, මෙම දෙවන වගඋත්තරකරු පැමිණිල්ල විභාග කිරීමේදී අනෙක් පාර්ශවය සමඟ ඇඩි හිතවතකමක් දක්වමින් පැමිණිල්ල විභාග කරන ලද අතර, සුමනාවතී යන අය ප්‍රකාශ කළ සියලු කරුණු පිළිගත් දෙවන වගඋත්තරකරු පැමිණිලිකාරියට වචනයක් හෝ කතා කිරීමට අවස්ථාව ලබා නොදුන් බවත්, පැමිණිලිකාරිය




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

විසින් සුමනාවතී යන අයගෙන් ලබා ගත්තා යැයි සුමනාවතී විසින් ප්‍රකාශ කරන ලද මුදල් ප්‍රමාණය ලබා දෙන ලෙසට දෙවන වගඋත්තරකරු පැමිණිලිකාරියට තර්ජණය කරන ලද බවත් ප්‍රකාශ කර ඇත.

මෙම පළමු සිදුවීමෙන් පසු පැමිණිලිකාරියගේ දුරකතනයට ගිරිබාව පොලීසියේ ඕ.අයි.සී මහත්තයා යැයි දක්වමින් යම් අයෙකු ඇමතුමක් ලබා දුන් බවත්, පසුදින උදේ 10.00 ට පොලීසියට පැමිණෙන ලෙසත් එසේ නොපැමිණියහොත් රිමාන්ඩ් කරන බවත්, ඔහු විසින් ප්‍රකාශ කරන ලද බවත්, සඳහන් කර ඇත. නැවත දිනෙක පැමිණිලිකාරිය නිවසේ නොසිටි අවස්ථාවක නිවසට පැමිණි ඕ.අයි.සී මහතා පොලීසියට එන ලෙස දැනුම් දී තිබූ බැවින් ඒ අනුව තමා පොලීසියට යෑමට තීරණය කර සිටියදී, ඒ අතරතුර තම නිවසට පැමිණි සුමනාවතී සහ අමරසිංහ යන දෙදෙනා ඕ.අයි.සී මහතා කතා කරන බව පවසා දුරකතනය ලබා දුන් බවත්, ඒ අනුව එම දුරකතනයෙන් කතා කළ ඕ.අයි.සී මහතා පසුදින උදේ 9.00 ට පොලීසියට පැමිණෙන ලෙස දැනුම්දුන් බවත්, එසේ නොපැමිණියහොත් ගල්ගමුව පොලීසියට කියා පැමිණිලිකාරියව අත්අඩංගුවට ගන්නා බවට ප්‍රකාශ කරන ලද බවත් සඳහන් කර ඇත.

ඉහත දැනුම්දීම අනුව පැමිණිලිකාරිය 2014.02.24 දින උදේ 9.00 ට පැමිණිලිකාරියගේ මිතුරෙකු සමඟ ගිරිබාව පොලීසියට ගිය බවත්, එසේ පොලීසියට යන විට සුමනාවතී වන අය සහ ඇය සමඟ තවත් අයෙකු පොලීසියට පැමිණ සිටි බවත්, ටික වේලාවකින් පළමු වගඋත්තරකරු පැමිණ ඔහුගේ කාර්යයාලයට පැමිණෙන ලෙසට දැනුම්දුන් බවත්, ඒ අනුව එම කාර්යයාලයට ගිය විට සුමනාවතී සහ අමරසිංහ යන අයද එම ස්ථානයට පැමිණි බවත්, ඔහුගේ ඉදිරියේදී පළමු වගඋත්තරකරු තමන්ට කෑ ගැසූ බවත්, තමාට පොලීසිය සුපුරුදු ස්ථානයක් නොවූ නිසාත්, තමා සමඟ කිසිවෙකු නොසිටි නිසාත්, අසරණ තත්වයට පත් වූ බවත් ප්‍රකාශ කර ඇත.

පළමු වගඋත්තරකරු තමන්ගෙන් කිසිවක් නොඅසා සුමනාවතී යන අයට රු:370,000 ක් ලබාදෙන ලෙසට ප්‍රකාශ කළ බවත්, එසේ ලබා නොදුනහොත් රිමාන්ඩ් කරන බවට තර්ජණය කළ බවත්, පැමිණිලිකාරිය කරුණු පැහැදිලි කිරීමට උත්සාහ කළ නමුත් වචනයක්වත් කතා කිරීමට අවස්ථාව ලබා නොදුන් බවත් පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත.

ඉන්පසු වගඋත්තරකරු එම ස්ථානයේ සිටි දෙවන වගඋත්තරකරුට පැමිණිලිකාරියව අත්අඩංගුවට ගන්නා ලෙසට නියම කළ බවද, එසේ නියම කර ඔහු පිටව ගිය පසු දෙවන වගඋත්තරකරු පැමිණිලිකාරියව ඇතුළත පුටුවක වාඩි කරවා පිටතට එන්නට නොදී කෑම හෝ ජලය උගුරක්වත් නොදී සවස 5.30 වන තුරු රඳවා ගෙන සිටි බවත්, පැමිණිලිකාරිය පොලීසියට පැමිණෙන විටදී දරුවන් පාසැල් යවා කුඩා දියණිය අසල්වැසි නිවසක නවතා පැමිණි බවත්, එම දරුවන් පිළිබඳ දැනුම් දීමටවත් පොලිස් ස්ථානයෙන් පිටතට පැමිණීමට ඉඩ ලබා නොදුන් බවත්, තම පුතා පාසලේ ගේට්ටුව අසල සවස 5.00 වන තෙක් අඬමින් සිටියදී අසල්වැසියෙකු දැක නිවසට ගෙනවිත් ඇරලවා තිබූ බවත් ප්‍රකාශ කර ඇත.

නැවත පස්වරු 6.00 ට පමණ පළමු වගඋත්තරකරු සිවිල් ඇඳුමින් කාර්යාලයට පැමිණ පැමිණිලිකාරියව කැඳවා සුමනාවතීගෙන් ගත්ත 370,000 දෙනවාද, නැතහොත් දින 14 ක් හිරේ යනවාදැයි විමසූ බවත්, විනාඩි 05 ක් තුළ එය දැනුම්දෙන ලෙස පැවසූ නමුත් පැමිණිලිකාරිය උත්තරයක් නොදී සිටියදී පැමිණිලිකාරියව වෙනත් කාමරයකට රැගෙන ගොස් පළමු හා දෙවන වගඋත්තරකරුද තවත් පොලිස් නිලධාරියෙක්ද, සුමනාවතී යන අයද එම ස්ථානයට පැමිණ පැමිණිලිකාරියට වාඩිවෙන්න කියා අනෙක් සියලු දෙනාම ඇයව වටකරගත් බවද, කොළයක් හා පෑනක් පැමිණිලිකාරියට ලබා දී පළමු වගඋත්තරකරු කියන දේ ලිවීමට දැනුම්දුන් බවත් ප්‍රකාශ කර ඇත. පැමිණිලිකාරිය කිසිවක් නොලියා සිටියදී පළමු වගඋත්තරකරු පැමිණිලිකාරිය රිමාන්ඩ් කරන ලෙස දෙවන වගඋත්තරකරු වෙත දැනුම් දුන් බවද, එසේ සිදුකළහොත් තම දරුවන් අසරණ වන නිසා පළමු වගඋත්තරකරු පැවසූ සියල්ල එම කොළයේ ලියූ බවත් ප්‍රකාශ කර ඇත.

ඔවුන් විසින් මුද්දර ගසා එකී මුද්දර උඩ තමාගේ අත්සන් ගත් බවද, නැවත තමාගෙන් කටඋත්තරයක්ද සටහන් කර ගත් බවත්, එහි ලියා තිබූ දේ තමා නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත. අනතුරුව පස්වරු 6.30 ට පමණ පොලීසියෙන් පිටත් කළ බවද දක්වා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පළමු වගඋත්තරකරු විසින් පැමිණිල්ලේ චෝදනාව ප්‍රතික්ෂේප කර ඇති අතර, පැමිණිලිකාරියව අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළ බව ප්‍රකාශ කර ඇත. පැමිණිලිකාරියට කරන ලද කැඳවීමකට අනුව පෙ.ව.11.00 ට පමණ ඇය පොලිස් ස්ථානයට පැමිණි බවත්, පැමිණිලිකාරියගේ ප්‍රකාශ පැය 17.40 ට අවසන් කරගත් බවත්, දෙපාර්ශවය ඉදිරියේ පැමිණිලිකාරිය ප්‍රකාශයක් ලබා දුන් බවත්, බලහත්කාරයෙන් ලියවාගෙන නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂි ලබා දීම සඳහා පැමිණිලිකාරියගේ විරුද්ධ පාර්ශවය වන සුමනාවතී සහ අමරසිංහ යන අය වගඋත්තරකරු සමඟ කොමිෂන් සභාව වෙත පැමිණ ප්‍රකාශයක් ලබා දී ඇති අතර, ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ, තමාගේ පැමිණිල්ලකට අනුව පොලිස් ස්ථානයේදී පරීක්ෂණයක් පැවැත් වූ බවත්, පරීක්ෂණ දිනයේ පෙ.ව.9.00 වන විට තමන් පොලිස් ස්ථානයට ගිය අතර, පැමිණිලිකාරිය පෙ.ව.10.30 - 11.00 ට පමණ පොලිස් ස්ථානයට පැමිණි බවත්, එහිදී කරුණු විභාග කිරීමෙන් අනතුරුව පැමිණිලිකාරියට මුදල් ලබා දීමට එකඟව ලිපියක් ලබා දුන් අතර, බලහත්කාරයෙන් ලිපියක් ලියවා නොගත් බවත්ය. ප.ව.5.30 පමණ පොලිස් ස්ථානයෙන් පිටව ගිය බවද ප්‍රකාශ කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු වශයෙන් එම්.වී.චමින්ද හේමචන්ද්‍ර යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශයක් ලබා දී ඇති අතර, ඔහු පැමිණිලිකාරියගේ ඉල්ලීම මත පැමිණිලිකාරිය සමඟ ඔහුගේ වෑන් රථයෙන් පොලිස් ස්ථානයට ගිය බවද, පොලිස් ස්ථානයේ පැවති පරීක්ෂණවලදී පැමිණිලිකාරියට කරුණු ඉදිරිපත් කිරීමට කිසිදු නිලධාරියෙකු අවස්ථාව ලබා නොදුන් බවද, ප.ව.6.00 පමණ වනතෙක් ඇයව පොලිස් ස්ථානයේ

රඳවා ගෙන සිටි බවද, ඉන්පසු පළමු වගඋත්තරකරු ඔහුට අවශ්‍ය ආකාරයට ලිපියක් ලියවා මෙම පැමිණිලිකාරියගේ අත්සන ලබා ගත් බවද ප්‍රකාශ කර ඇත.

එසේම පැමිණිලිකාරිය වෙනුවෙන්, එච්.එම්.ආශා සංජීවනී යන අය දිවුරුම් ප්‍රකාශයක් මඟින් කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇති අතර, එම අය විසින් සඳහන් කර ඇත්තේ, 2014.02.24 දින පැමිණිලිකාරිය සමඟ තමා පෙ.ව.9.00 ට පමණ ගිරිබාව පොලීසියට ගිය බවත්, පොලිස් ස්ථානයේදී පළමු වගඋත්තරකරු තර්ජනාත්මක ලෙස පැමිණිලිකාරියව ඔහුගේ කාර්යයාලය තුළට කතා කළ බවත්, එම ස්ථානයට පැමිණ සිටි සුමනාවතී සහ ඇයගේ අනියම් ස්වාමි පුරුෂයාගෙන් ලබා ගත් රු:370,000 ක මුදල ලබා නොදුනහොත් රිමාන්ඩ් කරන බවට පළමු වගඋත්තරකරු තර්ජනය කළ බවත්, පැමිණිලිකාරිය එවැනි මුදලක් ලබා නොගත් බවට බැගෑපත්ව ප්‍රකාශ කළ අතර, ඇයට කතා කිරීමට අවස්ථාව නොදී ඇයව රිමාන්ඩ් කරන ලෙස අනෙක් නිලධාරීන්ට දැන්වූ බවත්, පසුව ඇය ඇතුළට රැගෙන ගොස් පුටුවක වාඩිකරවා ප.ව.6.00 දක්වා පොලිස් ස්ථානයේ රඳවා ගෙන සිටි බවත්, තමා හා තමා සමඟ පැමිණි අනෙක් සහෝදරයාද ඇයව නිදහස් කරන ලෙස පළමු වගඋත්තරකරුගෙන් ඉල්ලා සිටියද, කතා කිරීමටවත් අවස්ථාව ලබා නොදුන් බවත් කියා ඇත.

**නිරීක්ෂණ :-**

ගිරිබාව පොලිස් ස්ථානයට ඉදිරිපත් වී තිබූ මුදල් ආරවුලක් පිළිබඳව පැමිණිලි විභාගයක් සඳහා වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකාරියවද, ආරවුලේ අනෙක් පාර්ශවයද පොලිස් ස්ථානයට කැඳවා ඇති අතර, එකී මුල් පැමිණිල්ල 2013.09.28 වන දින පොලිස් ස්ථානයට ඉදිරිපත් වීමෙන් පසු වගඋත්තරකාරියගේ ප්‍රකාශය 2013.09.28 දිනට සටහන් කරගෙන ඇති බව නිරීක්ෂණය වේ. අනතුරුව අදාළ ගැටළුව සමථ මූල මණ්ඩලය වෙත යොමු වී ඇති බවද නිරීක්ෂණය වේ.

නැවත 2014.02.06 දිනැති ලිපියක් මඟින් සහකාර පොලිස් අධිකාරී විසින් මෙම පැමිණිල්ල විභාග කිරීමට ස්ථානාධිපති, ගිරිබාව වෙත දැනුම්දීමෙන් අනතුරුව 2014.02.25 දින අදාළ පාර්ශවයන් කැඳවා ඇති බවද නිරීක්ෂණය වේ.

පොලිස් ස්ථානයේදී එදින ස්ථානාධිපති ඉදිරියේ මුදල් ලබා ගත් බවට සනාථ කරමින් පොරොන්දු පත්‍රයක් මෙම පැමිණිලිකාරිය වෙතින් අත්සන් කර ඇති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මෙම පැමිණිල්ල මඟින් පැමිණිලිකාරිය වගඋත්තරකාර පාර්ශවයට එරෙහිව ඉදිරිපත් කර ඇති මූලික චෝදනා වන්නේ, සාධාරණ හේතුවක් නොමැතිව පැමිණිලි විභාගය සඳහා යැයි පොලිස් ස්ථානයට කැඳවා පෙ.ව.9.00 සිට ප.ව.6.00 දක්වා රඳවා තබා ගැනීම, ආහාර, ජලය හෝ වෙනත් පහසුකම් නොදී රඳවා ගෙන සිටීම සහ ලිපියක් ලියා බලෙන් අත්සන් ලබා ගැනීම යන චෝදනා වේ.

පැමිණිලිකාරිය පැමිණිලි විභාගයක් සඳහා පොලිස් ස්ථානයට කැඳවන ලද බව වගඋත්තරකාර පාර්ශවය පිළිගෙන ඇත. එහෙත් දීර්ඝ කාලයක් රඳවා ගෙන සිටීම ප්‍රතික්ෂේප කරයි. කෙසේ වෙතත් පැමිණිල්ලේ සාක්ෂි මඟින් පැමිණිලිකාරියව පොලිස් ස්ථානය තුළ රඳවා ගෙන සිටි බවට කරුණු තහවුරු වේ. විශේෂයෙන්ම පළමු වගඋත්තරකරු විසින් පැමිණිලිකාරිය පෙ.ව.11.00 ට පමණ පොලිස් ස්ථානයට පැමිණි බවත්, පැය 17.40 ට ඇයගෙන් ප්‍රකාශයක් ලබාගත් බවත්, ප්‍රකාශ කිරීම තුළින් එවැනි කාලයක් පැමිණිලිකාරියව පොලිස් ස්ථානයේ රඳවා ගෙන සිටි බවට කරුණු තහවුරු වී ඇත.

ප්‍රනාන්දු එදිරිව සිල්වා සහ තවත් අය වන මූලික අයිතිවාසිකම් නඩු තීන්දුව කෙරෙහි අවධානය යොමු කිරීමේදී නිදාගැනීම ඇතුළු සාමාන්‍ය ශාරීරික කර්තව්‍ය සහ මූලික පහසුකම් නොමැති වීම, ප්‍රමාණවත් ආහාර නොමැතිව සිටීම, ඇතුළු මූලික අයිතිවාසිකම් නොමැතිව සිටීම, වෙනත් අය සමඟ කතාබහ කිරීමෙන් වළකා තැබීම, 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරිමක් බවට තීන්දු කර ඇත.

එසේම පොලිස් ස්ථානයේදී පොරොන්දු පත්‍රයක් අත්සන් කරවා ගෙන ඇති බවට කරුණු තහවුරු වී ඇත.

පැමිණිල්ලේ සඳහන් ආකාරයේ මුදල් ආරවුල් පිළිබඳ පැමිණිලිවලදී පොලිස් නිලධාරීන් හට නීත්‍යානුකූලව සිදු කළ හැකි කාර්යභාරය සීමිත වන අතර, එවැනි ආරවුල් සාකච්ඡා කර විසඳා ගැනීමට මැදිහත්වීම, සාමය ආරක්ෂා වන ලෙස කටයුතු කිරීමට පාර්ශවකරුවන් මෙහෙයවීම සිදුකළ හැකිව පවතී. ඉන් ඉදිරියට මුදල් ආරවුල් කටයුතු සිවිල් අධිකරණයකින් හෝ සමථ මණ්ඩලය මඟින් විසඳා ගැනීමට උපදෙස් දීම සිදුකළ හැක. එසේ තිබියදී පොලිස් ස්ථානය තුළදී පොරොන්දු ගිවිසුම්පත්‍ර අත්සන් කරවා ගැනීම හා එකී පොරොන්දු ගිවිසුම් පත්‍රවල සහතික කරන නිලධාරියා ලෙස ස්ථානාධිපතිවරයා කටයුතු කිරීම තුළින් මෙම පැමිණිලි විභාග කිරීමේ කටයුතුවලදී පක්ෂග්‍රාහීව කටයුතු කරන ලද බවට කරුණු පෙන්නුම් කර ඇත.

ඒ අනුව ඉදිරිපත් වූ සියළු කරුණු සලකා බැලීමේදී, මෙම පැමිණිල්ලට අදාළ සිදුවීමේදී පළමු වගඋත්තරකරු විසින් පක්ෂග්‍රාහීව සහ නීතිය අභිබවා කටයුතු කරන ලද බවට කරුණු නිරීක්ෂණය වන හෙයින්, එමඟින් පැමිණිලිකාරියට නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලබා ගැනීමේ අයිතිය අහිමි වී ඇති බවත්, එමඟින් ඇයගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදු වී ඇති බවටත් නිගමනය කළ හැක.

මේ අනුව, පැමිණිලිකාරියව පරීක්ෂණයකට ලක් නොකර සාධාරණ හේතුවකින් තොරව දීර්ඝ වේලාවක් පොලිස් ස්ථානයේ රඳවා ගෙන සිටීම, ඇයට අවශ්‍ය මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට අවස්ථාව ලබා නොදීම මඟින් පැමිණිලිකාරියව අමානුෂික සැළකිල්ලකට ලක් කිරීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බැවින්, මෙවැනි ආරවුල් පිළිබඳ පරීක්ෂණ කටයුතුවලදී නීතියට අනුකූලව කටයුතු කිරීමටත්, ස්වාධිනව හා අපක්ෂපාතීව කටයුතු කිරීමටත් පළමු වගඋත්තරකරුට අවවාද කරන ලෙසට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023 . 02 - 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

03. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/